# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2019 ජනවාරි

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## ආර්ථික ප්‍රතිසංස්කරණ හා පොදු සැපයීම් අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිකුත් කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, 2019 ජනවාරි මාසයේ ලක්ෂ්‍යාමය උද්ධමනය 1.2%ක් බව ප්‍රකාශ කළේය. පසුගිය දෙසැම්බර් මාසයේ ලක්ෂ්‍යාමය උද්ධමනය 0.4%ක් ලෙස වාර්තා විය. 2019 ජනවාරි මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ -2.2%ක හා ආහාර නොවන කාණ්ඩයේ 3.5%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2018 ජනවාරි මාසයේ 5.4% ක්වූ උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 4.0%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 1.4%ක් විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2018 දෙසැම්බර් මාසයේ 127.1ක් වූ දර්ශකාංකය 2019 ජනවාරි මාසයේ 127.3ක් දක්වා ඉහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2019 ජනවාරි මාසයේ දර්ශකාංකය 0.2ක වැඩිවීමක් එනම් 0.2ක ප්‍රතිශතකාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.93%කින් අඩුවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 1.05%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවීම සඳහා එළවළු, පොල්, දෙහි, ලොකුළූණු, අර්තාපල්, අමු මිරිස්, රතුළූණු සහ දෙල් යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීම බලපා ඇත. එසේ වුවත් අළුත් මාළු, පැපොල්, බිත්තර, කෙසෙල්, සහල්, කුකුල් මස්, අඹ සහ කරවල යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2019 ජනවාරි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන', 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය', 'රෙදිපිළි හා පාවහන්', 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු', 'අධ්‍යාපන' සහ 'විවිධ භාණ්ඩ හා සේවා' යන කාණ්ඩවල වියදම්වල වටිනාකම වැඩිවීම බලපා ඇත. එසේ වුවත්, 'ප්‍රවාහන' කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවී ඇත. ඉන්ධන මිල ගණන් ( පෙට්‍රල් සහ ඩීසල්) සහ බස් ගාස්තු අඩුවීම 'ප්‍රවාහන' කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවීම සඳහා බලපා ඇත. එමෙන්ම පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 'සෞඛ්‍ය', 'සන්නිවේදන', 'විනෝදාත්මක හා සංස්කෘතික' සහ 'ආපනශාලා සහ හෝටල්' යන කාණ්ඩවල වියදම්වල වටිනාකම වෙනස් වී නොමැත.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | දර්ශකාංකය | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | ලක්ෂ්‍යමය උද්ධමනය (%) |
|---|---|---|---|---|
| **2018** | ජනවාරි | 125.8 | -0.6 | 5.4 |
| | පෙබරවාරි | 123.7 | -1.7 | 3.2 |
| | මාර්තු | 122.8 | -0.7 | 2.8 |
| | අප්‍රේල් | 122.9 | 0.1 | 1.6 |
| | මැයි | 124.3 | 1.1 | 2.1 |
| | ජූනි | 126.5 | 1.8 | 2.5 |
| | ජූලි | 126.6 | 0.1 | 3.4 |
| | අගෝස්තු | 125.4 | -0.9 | 2.5 |
| | සැප්තැම්බර් | 124.4 | -0.8 | 0.9 |
| | ඔක්තෝම්බර් | 124.9 | 0.4 | 0.1 |
| | නොවැම්බර් | 127.7 | 2.2 | 1.0 |
| | දෙසැම්බර් | 127.1 | -0.5 | 0.4 |
| **2019** | ජනවාරි | 127.3 | 0.2 | 1.2 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව